Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# බළපිටිය ප්‍රාදේශීය සභාව

01. දකුණු පළාත් රාජ්‍ය සේවයේ බළපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුව පවතින අදාහනාගාර සහයක තනතුරක් සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිරව පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| ආදාහනාගාර සහයක | 01 | රා. ප. ච. 3/2016 අනුව PL1- 2016, 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන 02 ක් සහිතව විෂයයන් හය (06) ක් සමත්වී තිබීම. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

i. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. මෙම අය අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

ii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

iii. අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතුය.

iv. අයදුම්කරුවන් මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

vi. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

vii. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සපුරා තිබිය යුතු ය.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දය ක විය යුතුය.

(ii) බළපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(iii) තෝරා ගනු ලබන්නේ වසර 03 ක පරිවාස කාලයකට යටත්වය.

(iv) ඉහත සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා බළපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

05. *බඳවා ගන්නා ක්‍රමය :-* අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ ඇමුණුම් අංක 01 අනුව පහත සඳහන් පරිදි ලබා ගත් උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍රය | | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02. | අමතර සුදුසුකම් (උපලේඛන 02 ට අනුව අදළ නම්) | 10 | |
| 03. | පළපුරුද්ද (උපලේඛන 02 ට අනුව අදළ නම්) | 10 | |
| 04. | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන :*

1. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කෙරේ.
2. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" (A4) ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කර ගන්නා අයදුම්පත් 2018.05.12 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, බළපිටිය ප්‍රාදේශීය සභාව, බළපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දක්වා ඇති උපදෙස් වලට පටහැනිව අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපතක් අමුණා එවිය යුතු ය.

i. උප්පැන්න සහතිකය,
ii. අධ්‍යාපන සහතික/ශිෂ්‍ය කාර්ය දර්ශකය,
iii. පදිංචිය සනාථ කිරීමේ සහතකිය (පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව මාස 06 ක් තුළ දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය),
iv. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්,
v. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්),
vi. සේවා පළ පුරුද්ද පිළිබඳ සහතික,

08. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල බළපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත,
ලේකම්,
බළපිටිය ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ මාර්තු මස 22 වැනි දින,
බළපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ බළපිටිය ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සහායක තනතුර සඳහා අයදුම්පත

01. (i) මුලකුරු සමග නම :———————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :———————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————————.
03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———————————.
04. ස්ථිර පදිංචි ලිපිනය :———————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :———————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :———————————.
07. උපන් දිනය වර්ෂය:——————— මාසය:——————— දිනය:———————
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :——————— මාස :——————— දින:———————
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :———————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) (සහතිකවල පිටපත් අමුණන්න):

———————————————————————————

———————————————————————————

———————————————————————————

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න) :

———————————————————————————

———————————————————————————

12. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්,
(i) තනතුර:———————————.
(ii) සේවය කරන ස්ථානය:———————————.
(iii) පත්වීම් දිනය:———————————.

13. ඔබ කවරදාක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?:–

———————————————————————————

———————————————————————————

———————————————————————————

14. *අයදුම්කරුගේ සහතිකය* :- මෙම අයදුම්පතේ ම' විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි.

———————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————.

15. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම් සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා තෝරාගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැක/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

———————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :———————————